## 1.1 හැඳින්වීම

අංග රචනය වූකලී ප්‍රබල කලාත්මක සිතුවමකි. එනම් නිර්මාණයකි. ඒ තුළින් මානව ඉන්ද්‍රියනට ගෝචර වන සංස්ථානයන් ප්‍රතිනිර්මාණය කිරීමක් සිදුවේ. එම සංස්ථානය හෙවත් රූප ස්වභාවය නිර්මාණය කිරීම උදෙසා වර්ණ, රේඛා සහ හැඩතල යන පදාර්ථයන් අංගරචනා කලාව තුළදී භාවිතාවෙහි යෙදේ. මෙලෙස වර්ණ, රේඛා, හැඩතල යන ත්‍රිත්වයම නිර්මාණාත්මක ලෙස සම්පිණ්ඩනය කිරීම අංග රචනය හෙවත් make up ලෙස කැටි කොට දැක්විය හැක.

ප්‍රාසංගික කලා මාධ්‍යය අතර දෘෂ්‍යම පාර්ශවයක් ලෙස ප්‍රේක්ෂකයා වෙතට විවර වූ අංග රචනය යනු, ස්වභාව ධර්මය ඇසුරෙහි හැදී වැඩුණු මිනිසා වර්ණයේ ප්‍රාතිහාර්ය සොයාගැනීමත් සමඟ බිහිවූ කලාත්මක පාර්ශවයකි. නමුත් ඔහු විසින් එය උපයෝගි කර ගනු ලැබුවේ අංග රචනා කලාව උදෙසා නොව. මිනිස් සන්තානයෙහි පහළ වූ ස්වභාවික සහ මනෝමය චිත්ත රූප, සිතුවිලි රැසක් එළි දැක්වීම උදෙසාය. පසු කාලීනව අංග රචනා කලාවක් බිහිවීම උදෙසා එය මූලික පදනමක් විය.

ප්‍රේක්ෂකයන් සමූහයක් අභියස ඉදිරිපත් කරනු ලබන "ප්‍රාසංගික කලා" නම් වූ පුළුල් ක්ෂේත්‍රය තුළ "නර්තනය" වනාහි මානව ඉන්ද්‍රියන්ට ගෝචර වන දෑ නිර්මාණය කරනු ලබන කලාත්මක මාධ්‍යකි. එය අධ්‍යතන කාල පරාසය තුළ බිහිවූ විශ්ව ප්‍රකාශන මාධ්‍යයයි.

නර්තනය හෙවත් Dance යනු සතර අභිනය මූලික වූ විෂයකි. ඉංග්‍රීසි භාෂාවෙන් Dance සහ Dancing යන පද ජර්මන් බසින් පැමිණි Danson යන පදයෙන් බිඳී පැමිණ දේශිය ව්‍යවහාරය සඳහා එක් වී ඇත.

ස්වභාව ධර්මය සහ සාමූහික ශ්‍රම ක්‍රියාකාරීත්වයෙහි රිද්මය මිනිසා කෙරෙහි ඇති කරන බලපෑම, මනෝභාවයන් ශරීරය හරහා ප්‍රතිනිර්මාණය කිරීම නර්තන මාධ්‍ය තුළින් සිදුවන මූලික ක්‍රියාවලියයි. මෙහිලා බාහිර සහ අභ්‍යන්තර බලවේගයන් දෙක තුළින් සිදු වනු ලබන අන්තර් සබඳතාවය සෞන්දර්යාත්මක ලෙස වින්දනය කිරීම උදෙසා මිනිස් ශරීරය භාවිත කිරීමේ විශිෂ්ටතම අවස්ථාවක් ලෙස "ප්‍රාසංගික නර්තනය වේදිකාව" නම් වූ කලා මාධ්‍ය බිහි විය.

අනාදිමත් කාලයක සිට පැමිණි ශාන්ති කර්ම පදනමක් මත පිහිටුවමින් බිහිවූ දේශිය නර්තනය, නූතන වේදිකාව කරා ගමන් කිරීම උදෙසා පදනම සැදුනේ 1934 දී තාගෝර් ආගමනයෙන් පසුවය. එම හේත්වර්ථයෙන් නව්‍යකරණය වූ දේශීය නර්තනය ලද දායාදය නම් මුද්‍රා නාට්‍ය කලාවයි. මුද්‍රා නාට්‍ය කලාව නම් වූ නව සංකල්පය හරහා පැමිණි නිර්මාණාත්මක නර්තන "ප්‍රාසංග වේදිකාව" නම්වූ ව්‍යූහයට ප්‍රවිෂ්ට වූයේ නූතනත්වය හරහා වීම ඉතා වැදගත්ය.

මුද්‍රා නාට්‍ය නූතනත්වය හා ගැටීම හේතුවෙන් බිහිවූ වේදිකා නර්තන කලාව හුදෙක්ම ප්‍රේක්ෂකයන් උදෙසාම වෙන් වූවකි. ස්වභාව ධර්මය ඇසුරෙහි හැදී වැඩුණු මිනිසා ප්‍රාසංගිකත්වය කෙරෙහි ආකර්ශනය වූයේ නිතැතින්මය. ප්‍රාසංගිකත්වයෙන් පරිපූර්ණ වූ වේදිකා නර්තනය උදෙසා මිනිසා ආකර්ෂණය වූයේ ඔහු තුළ සහජයෙන් පැවැති සංවේදිතාවය හේතු වෙන යයි නිශ්චය කළ හැක.

ප්‍රාසංගික වේදිකාව නම් වූ ව්‍යූහය තුළ භාවිත නර්තනය පටිතයක් ලෙස ගත්කළ හුදෙක් නිර්මාණශිලිත්වයක් උසුලනු ලැබේ. මොහොතින් මොහොත වෙනස වනු ලබන මෙම නිර්මාණශිලි බව තීව්‍ර කිරීම උදෙසා උක්ත පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද අංග රචනය තුළින් හිමිවන දායකත්වය ඉතා ප්‍රබලය.

ප්‍රාසංග වේදිකාව තුළ අංග රචනය වනාහි ප්‍රබල ලෙස භාෂාත්මක නිරූපණයෙහි ලා උපයෝගි වන මාධ්‍යයයි. අංග රචනය සහ නර්තය තුළ පවතිනුයේ අතිශය සමීප සබඳතාවයකි. ඕනෑම කලා මාධ්‍යක් ගත්තද එහි ආමන්ත්‍රණය යොමු වී ඇත්තේ ප්‍රේක්ෂක හැඟිම් උද්දීපනය කරවන අටියෙනි. නර්තනය තුළද සිදුවන මෙ ආමන්ත්‍රණය සිදු කිරීමෙහි ලා අංග රචනය ප්‍රබල ලෙසම දායකවේ.

ගෝලියකරණය තුළින් සිදුවූ සමාජ සංකීර්ණත්වය හේතුවෙන් ප්‍රාසංගික නර්තන වේදිකාව මත සිදුවූ නව්‍යකරණය අංග රචනා කලාවට ද ප්‍රබල ලෙසින් බලපෑමක් එල්ල කරන ලදී. කලාත්මක පාර්ශවයන් තුළින් මෙන්ම තාක්‍ෂණික පාර්ශයන් තුළින් ද සිදුවූ මෙය අංග රචනා කලාවේ ප්‍රගමණය උදෙසා දායක වීමට හේතු කාරක විය.

විශේෂයෙන් ශරීරය මෙවලමක් කොට ගෙන ඉදිරිපත් කරනු ලබන අධ්‍යතන නිර්මාණයන් තුළ අංග රචනාව නිර්මාණය වීමේදී පරීක්‍ෂණ  ක්‍රමවේදයකට අනුව එය සිදු කිරීමට නූතන නිර්මාණ කරුවන් විසින්  පෙළඹී ඇත. පෙරදිග මෙන්ම බටහිර ආභාෂය කැටිකොට ගත් අංග රචනා උපක්‍රමයන් නිර්මාණශිලි ලෙස මෙහි භාවිතයෙහි යෙදෙයි. මේ සඳහා වර්ණ, රේඛා, හැඩතල නම් වූ මාධ්‍යන් උපයෝගී කොට ගනිමින් විචිත්‍රවත් ලෙස මැවීම් සිදු කරයි.

බොහෝ දුරට ශ්‍රී ලාංකේය නර්තන කලාව තුළ අංග රචනා කාර්‍යයෙහි නියැලෙනුයේ නර්තන ශිල්පීන්ම වීම වැදගත් වේ. ඔවුන් තම ක්‍ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමකින් සහ පරිචයකින් යුතු වීම ඊට හේතුවයි. අංග රචනය යනු හුදෙක්ම වෙනම ශිල්පීය පාර්ශවයක් වී නමුදු දේශිය නර්තන වේදිකාව තුළඑය නර්තනයෙහිම විශේෂ අංගයකි.  මෙහිදී රංග වස්ත්‍රාභරණ, ආලෝකය, රංග භාණ්ඩ, පසුතලය, රංග වින්‍යාසය ආදි මේ සියල්ලක්ම පිළිබඳව නර්තන නිර්මාණ ශිල්පියා විසින් අවබෝධයෙන් සිටිය යුතුය.

ඕනෑම නර්තන නිර්මාණයක් උදෙසා නර්තකයා අංග රචනය කිරීමේදී අදාල නිර්මාණය පිළිබඳ පූර්ණ අවබෝධයකින් යුතුව සිදු කළ යුතුව ඇත. මන්දයත් අංග රචනය තුළින් සත්‍යානුරූපී මායාවක් කෙරෙහි ප්‍රේක්ෂකයා ඇද බැද තබා ගන්නා බැවිණි. එසේ නොමැති වුවහොත් නිර්මාණය කෙරහි ප්‍රේක්ෂක රසාස්වාදය මෙන්ම ආකාර්ශණීයත්වය ද බිඳී යනු ඇත.

නර්තකයා හට සමාරෝපණ කාර්යයෙහි ලා මහෝගයක් වන අංග රචනය මගින මුහුණෙහි පවතින සියුම් ඉන්ද්‍රියන් පවා ඉස්මතු කොට දැක්විය හැකි වීම අංග රචනා කලාවට පමණක් සීමාවූ සුවිශේෂි භාවයකි. මෙම හැකියාව හේතුකොට ගනිමින් අධ්‍යතනය වන විට අංග රචනය වේදිකා නර්තන මාධ්‍ය තුළ ප්‍රබල භාවිතාවක්ව පවතී.

උක්ත සඳහන් කරුණු සංශිප්ත කිරීම මත ප්‍රාසංගික වේදිකා නර්තනයෙහි අංග රචනය, නර්තනය උදෙසා ප්‍රබල බලපෑමක් එල්ල කරමින් නිර්මාණකරණයෙහි නියැලෙන බව පැහැදිලිය.

මෙම පරීක්‍ෂණ නිබන්ධනය තුළින් සනාථ කිරීමට උත්සාහ දරණුයේ ප්‍රාසංගික නර්තන වේදිකාව මත භාවිත අංග රචනය පුළුල් ප්‍රකාශන මාධ්‍යක් ලෙස උපයෝගි කොට ගන්නා බවය. මෙම මාතෘකාව පිළිබඳ මා විසින් අධ්‍යනය කිරීමට පෙළඹුනු හේතු සාධකය නම් අංග රචනා කලාව නර්තනය තුළ ප්‍රබල ලෙසින්ම බලපෑමක් සිදු කිරීමයි. මේ පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමට මම මෙම නිබන්ධනය උපයෝගි කොට ගනිමි.

එසේ හෙයින් උක්ත කරුණු සියල්ල පාදක කොට ගනිමින් අධ්‍යතන ප්‍රාසංගික නර්තන වේදිකාව මත භාවිත අංග රචනය පිළිබඳ පුළුල් අවබෝධයකින් යුතුව අධ්‍යන කිරීමට කැමැත්තෙමි. ඒ ඔස්සේ නර්තනය යනු කුමක්ද? යන්න පිළිබඳවත් මාගේ පරීක්‍ෂණ මූල බීජය කොට ගනිමින් ඒ පිළිබඳව මෙම නිබන්ධනය කිරීමට පෙළඹුනෙමි.

අංග රචනා කලාව පිළිබඳ වර්තමානයේ විවිධ ඉසව් ඔස්සේ සාකච්ඡාවට බඳුන් වුවද වේදිකා නර්තනය තුළ භාවිත අංග රචනය පිළිබඳ මෙතෙක් කතිකාවකත් ගොඩනැගී නොමැත. එබැවින් මෙය නූතනය තුළ කාලෝචිත මාතෘකාවක් යයි අනුමාන කරමි.